ආදරණීය අම්මේ තාත්තේ,


හංසනි තෙබුවන

මට මතකයි, මගේ පුංචි කාලේ මගේ දෙමව්පියෝත්, මගේ යාළුවන්ගේ දෙමව්පියෝත්, අපිට සිංහළ උගන්වන්න, සිංදු, කවි, කථා, නැටුම් වැනි දේවල් උගන්වන්නත් ගත්ත මහන්සිය. ඒ කාලේ මමත් අනික් අය වගේම සමහර වේලාවට ඒවට අකමැති වුනා තමයි. ඒත් ටික ටික ලොකු වෙනකොට අපේ රටේ සිරිත් විරිත්, සංස්කෘතිය ගැන දැනුමක් ලැබෙන කොට, සිංහල භාෂා පාසලේ සංස්කෘතික උත්සව වලට සහභාගී වෙන කොට හිතුනේ මේවා තමයි කෙනෙකුට ජීවිතයට අවශ්‍ය දේවල් කියලා. ඒ වගේ දේවල් වලින් ලැබෙන්නේ විනෝදය සතුට විතරක් නෙමෙයි. ජීවිතයට අවශ්‍ය අත්දැකීම් ගොඩකුත් ලැබෙනවා කියලයි මම නම් විශ්වාස කරන්නේ.

ඉතින් අම්මේ තාත්තේ, අපි වගේ අයගේ ඒ දක්ෂතා එළියට අරගෙන ඔබ වෙත ඉදිරි පත් කරන්නට ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනීය ආදී ශිෂ්‍ය සංගමයේ මාමලාගේ ආරාධනය අනුව අප පිහිටුවා ගත්ත යොවුන් සමාජය මඟින් මාර්තු මස 15 වැනි දා Besen Centre හිදී අපේ පළමු සංදර්ශණය එළි දැක්වීමට අපි සැදී පැහැදී සිටින්නෙමු. එයට අවශ්‍ය වන පුහුණු වීම් කටයුතුකරගෙන යන අපි සමහර වෙලාවට පුදුමයට පත්වන්නෙමු. මන්ද යත් මීට පෙර නැටුම් කණ්ඩායම් වලට සහභාගී වුන අය, එහෙම නැතිනම් සිංහළ භාෂා පාසල්වල ඉගෙන ගත්ත අය විතරක් නෙමෙයි ඒ වගේ කිසිම දේකට සහභාගී නොවුන අයත් කරන ඉදිරිපත් කිරීම් දැකලා.

ඇත්තමයි, අපි විතරක් නෙවෙයි ඒ ළමයින්ගේ දෙමාපියොත් පුදුම වෙනවා. සතුටු වෙනවා එයාලගෙ ළමයින්ට මෙච්චර හැංගිච්ච දක්ෂතා තියෙනවද කියලා. ඒ දක්ෂතා වේදිකාව ඉදිරියට ඇවිත් කරන නැටුම්, ගැයුම්, වැයුම් වලට සීමා වෙලා නැහැ- ප්‍රවේශ පත්‍රයේ සිට වේදිකා පරිපාලනය ඇතුළු සියළු කටයුතු කිරීමට බලාපොරොත්තු වෙන අපි, අපිව විශ්වාස කරගෙන මේ සියළු වගකීම් අපට ලබාදී පැත්තක සිට එහි අ පා පෙන්වාදෙමින්, අපිට අයත් අපේ සංස්කෘතික උරුමයන් උරුම කර දෙන්නට වෙර දරන ශ්‍රී ලං.ජ.ක.කා.අ.ආ ආදිශිෂ්‍ය සංගමයේ මාමලාට සහ එම පවුල් වල අයටත්, මෙයට නන් අයුරින් උදව් දෙන සියළුම දෙනාටත් ස්තුතිවන්ත වන්නෙමු.

ඒ වගේම මේ ලිපිය කියවන ඔබ සැමදෙනාටම මෙයට සහභාගී වී අපි සැම දෙනාවම දිරිමත් කරන ලෙසට හා සතුටු වී විනෝද වී අපගේ අත් දැකීම් ඔබගේ දරුවන්ටත් ලබාදෙන මෙන් අපගේ, ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනීය ආදිශිෂ්‍ය සංගමයේ තරුණ සංගමය වෙනුවෙන් මම ආරාධනා කරමි.




මෙයට

හංසනි තෙබුවන
SLGTTIOBA Youth Group Coordinator.

## අපට ආඩම්බර විය හැකියි

විදේශ රටක ජීවිත ගතකරන අපගේ ජාතියක් සංස්කෘතියක් කලාවත් ආධ්‍යාත්මික ගුණවගාවත් රැක ගැනීමට සහ එය ශ්‍රීලංකික මෙන්ම අන්‍ය ජාතිකයන් අතර බෙදා හදා ගන්නට ප්‍රමුඛව කටයුතු කරන ආදි ශිෂ්‍ය සංගමයක් හැටියට අප ආ දුර බොහෝය.

## මතු පරපුරට දායාද කල යුතුයි.

යොවුන් මනසක් තවමත් හිමි අප ආ මග හැර බලන විට දසක දෙකකට ආසන්න කාලයක් ගෙවී ඇතුවා මෙන්ම, ඒ මග රැගෙන යන්නට සුදුසු පරපුරක්ද අප තුලින් බිහිවී ඇත. අපගේ ශ්‍රීලංකීය අනන්‍යතාවය තව තවත් පතුරුවා ලන්නටත් පුබුදුවා ලන්නටත් සැදෑ කාලයේ සැනසුම් ජීවිතයක් ගතකරන්නටත් මේ යොවුන් පරපුර ඉදිරිපෙලට ගන්නට කාලය පැමිණ ඇත.... ඒ පරම පිවිතුරු ප්‍රාර්ථනයේ මල්පල ගැනීමකි මෙය.

ශ්‍රීලංකීය සම්භාව්‍යක් ඇති මතු පරපුරට අත දෙන්නට සැදූ මෙම වේදිකාව දක්ෂකම් ඇති අයට එළි දැක්වීමටත් අනෙකුත් දරුවන්ට මග පෙන්වීමටත් අපේ දරුවන් තුල තව තවත් අපේ කම රඳවා ගන්නටත් තෝතැන්නක් වෙනවාට කිසිම සැකයක් නැත.

ඔවුන්ගේ දක්ෂකම් දැක බලා ගන්නටත් ඔවුනට අත දෙන්නටත් අප දරන ප්‍රයත්නය සාර්ථක කරගන්නටත් අප සමග එකතුවන්න.


ශාන්ත නානායක්කාර
සභාපති SLGTTIOBA

Aus$50/month / SLRs5000/month
8 years old Teak Land at Dambulla for Sale.
Selling Price 10 Lakhs ( 25,000/- per Teack purch )

Following are the details.
1. Teak Land of 40 Purches
2. 100 Trees are grown in 40 Purches
3. Teak Land maintain by Help Green Limited.
4. Clear Deads.
5. Trees can be cut after another 7 years. ( 8 + 7 = 15 years)
6. Help green ( or there are many export companies are here) will purchase each tree at 100,000.00 or more than that after 7 years.
7. You can earn 10,000,000.00 from the fisrt teak lot
8. After cuting the trees, you can use the land to build house etc..
9. LAnd will maintain by HelpGreen under maintenance of Rs. 2000.00 - 3000.00 per year
10 .This is a good investment for Childrens to grow with them.
11. Help Green is selling new plots at 450,000/- now. But this land is aprox 8 years old now.

Please contact
Indika 94 773 623 014 / email- ind_ika@yahoo.com

ගායනා පන්ති - 2009
පෙබරවාරි මස 08 වැනිද, ඇරඹේ
මෙහෙයවීම –
සංගීත අධ්‍යක්ෂ
තරුපති මුණසිංහ
Bachelor of Arts (Kelaniya), Master of Arts (J'pura), Diploma in Writer ship & Communication (J'pura)

Thomas Town Library hall.
52 Main Street Thomastown

සෑම ඉරිදාවකම උදෑසන 9.00 සිට ළමුන් සහ වැඩිහිටියන් දෙපාර්ශවයම සඳහා පන්ති පැවැත්වේ.

(Mobile) 0413745366 / (home) 0359405226 (5 pm - 10 pm)

එන්න! නිවැරදිව ගයන්න ඉගෙන ගන්න!

Auslanka Study Center
No Service Fee
Free Consultation for International Students

Want to change education provider ?
Need to change the course ?
Visa sub class 572, 573
Need to select the right course to apply for PR ?
Have you completed your Diploma and want to do your Degree ?
Don't pay high course fee.

Talk to leading education consultants for
- Change of education provider
- Uni/Tafe placement
- Visa sub class 572, 573
- Select the right course to apply for PR

Mobile 0433 023 687
Telephone / Fax 9568 2557
www.auslanka.edu.lk (*Call, SMS or email*)
eranl@auslanka.edu.lk
ABN 50758298781
Scholarships are available for limited Numbers of Students *
*Condition apply